## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - 2017

-----------------------------------------------------

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(අ) සමාලෝචිත වර්ෂය තුළ මහෝපාධ්‍ය අරමුදලින් රු. 3,000,000 ක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කර තිබුණද, එය ස්ථාවර තැන්පතු ලෙස වෙනම දැක්වීම වෙනුවට ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය තුල දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට පිළියෙල කර තිබුණු නමුත් ප්‍රමිතයේ 132 (අ) ඡේදය ප්‍රකාරව ඒ බව සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර විභාග ඒකකය පවත්වාගෙන යන කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටා ඇති විශ්වවිද්‍යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වසර 20 කට පෙර බෞද්ධ කටයුතු අමාත්‍යාංශයෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු. 10,000,000 ක් වටිනා ඉඩම සහ විවිධ පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.81,122 ක් වටිනා උපකරණ සහ රු. 210,655 ක් වටිනා දැව භාණ්ඩ සමාලෝචිත වර්ෂය දක්වා පරිත්‍යාග ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර අදාළ වත්කම්වල ක්ෂයවීම් වලට සාපේක්ෂව ඒවා ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රාග්ධන පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු. 2,387,930 ක් වූ පොත්පත් සහ වාර සඟරාවලට අදාළ ක්ෂය හා ක්‍රමක්ෂය ප්‍රමාණය විගණනයේ ගණනය කිරීම්වලට අනුව රු.401,707 ක් විය යුතු නමුත් 2014 වර්ෂයේ දී පරිත්‍යාග ලෙස ලැබුණු රු.349,322 ක පොත්පත් සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය කිරීමේදී රු.70,383 ක් ලෙස සැලකීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය සහ ක්‍රමක්ෂය රු. 55,786 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2011 වර්ෂය දක්වා පොත්පත් හා වාර සඟරා ලෙස ලැබී තිබූ පරිත්‍යාග රු.1,244,125 ක් ක්‍රමක්ෂය කර නොතිබුණි. තවද ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පරිත්‍යාග ලෙස ලැබී තිබූ වත්කම්වලට අදාල ක්ෂය සහ ක්‍රමක්ෂය රු.1,447,274 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් සහ සැපයුම් කොන්ත්‍රාත් 32 කට අදාළව ආයතන 26 කට ගෙවිය යුතු වූ කොන්ත්‍රාත් මත රඳවා ගැනීමේ මුදල් රු. 14,964,281 ක් පැවතුන අතර අදාළ ඉදිකිරීම් සහ සැපයුම් සම්බන්ධයෙන් වූ පසු විපරම් කටයුතුවල අඩුපාඩු හේතුවෙන් එම මුළු රඳවා ගැනීමේ මුදලින් සියයට 72 ක් හෙවත් රු. 10,837,524 ක් වසර දෙකකටත් වැඩි කාලයක සිට පවතින බව නිරීක්ෂණය විය. ඉන් රු.9,380,019 ක් 2013 සහ ඊට පෙර වර්ෂවල සිදු කරන ලද විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්වලට අදාළව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවිය යුතුව පැවැති කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් දෙකක් බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 135 | ගිණුම් අංශයෙහි රු. 25,000 බැගින් වූ අග්‍රිමයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර අදාළ අග්‍රිමයේ වගකීමද මුදල් රෙගුලාසි 135 ට පටහැනිව ප්‍රධාන මුදල් අයකැමි වෙතම පවරා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) (ආ) | මාණ්ඩලික නිලධාරීන්ට පමණක් අත්තිකාරම් නිකුත් කළ හැකි වුවද මාණ්ඩලික නොවන නිලධාරීන්ටද අත්තිකාරම් නිකුත් කර තිබුණු අවස්ථා 64 ක් නිරීක්ෂණය විය. |
| (iii) මුදල් රෙගුලාසි 371 (5) | තත්ත්කාර්ය අත්තිකාරම් ලබාගත් නිලධාරියකු අදාළ කාර්යය නිමකළ විගස හෝ දින 10 ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතු වුවද රු. 828,901 ක් වූ අත්තිකාරම් 33 ක් ආපසු පියවීම දින 11-56 අතර කාල පරාසයක් ප්‍රමාදකර තිබුණු අතර එකතුව රු. 46,165 ක් වූ අත්තිකාරම් 4 ක් කිසිදු වියදමකට යොදා නොගෙන ආපසු පියවා තිබුණි. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති හා 30/2016 දරන රජයේ වාහන නඩත්තු කිරීම පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | |
| 3.1 වගන්තිය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින් පසුව හෝ කි.මී 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව ඉන්ධන දහනය කොපමණදැයි පරීක්ෂා කළ යුතු වුවත් 2014 අගෝස්තු මස පරීක්ෂා කිරීමෙන් පසුව සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව වසර 3 ක් ඉන්ධන දහනය පිළිබඳව වාර්තාවක් ලබාගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 8,665,039 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,099,101 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 9,764,140 කින් පිරිහී තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර රු. 24,661,000 කින් වැඩි වුවද පුද්ගල පඩිනඩි හා වෙනත් වියදම් පිළිවෙලින් රු. 26,947,051 කින් හා රු. 5,557,419 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.2,300,007 ක් ලෙස පැවති ඌනතාවය 2014 සහ 2015 වර්ෂවලදී පිළිවෙලින් රු.2,626,061 ක සහ රු. 36,960,804 ක ඌනතාවයක් දක්වා වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයේදී රු.1,099,101 ක අතිරික්තයක් ලබා ඇති නමුත් නැවත සමාලෝචිත වර්ෂයේදී රු.8,665,039 ක ඌනතාවයක් ලබා තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික රාජ්‍ය බදු හා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 149,207,572 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. 279,062,969 ක් බවට පත්වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයින් 438 ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු. 282,381,892 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 378 ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු. 248,048,703 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය පිළිවෙලින් රු. 644,708 ක් හා රු. 656,214 ක් වූ බැවින් සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාවේ සිදුවූ වර්ධනය ඒක ශිෂ්‍ය පිරිවැය සියයට 2 කින් පමණ අඩුකිරීමට ප්‍රධාන වශයෙන් දායක වී ඇති බව නිරීක්ෂණය විය. එබැවින් වියදම් පාලන ක්‍රම අනුගමනය කිරීමට අමතරව බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව තවදුරටත් වර්ධනය කර ගැනීම කෙරෙහිද විශ්වවිද්‍යාලයේ අවධානය යොමු විය යුතුවේ.

(ආ) රජයේ ප්‍රදාන හැරුණු විට විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ආදායම් මාර්ගය වන බාහිර පාඨමාලා පවත්වාගෙන යාමෙන් සමාලෝචිත වර්ෂයේදී ලබා තිබුණු ආදායම රු. 42,975,538 ක් වූ අතර ලබා තිබුණු අතිරික්තය රු.11,102,664 ක් එනම් ආදායමෙන් සියයට 25.8 ක් විය. එසේ වුවද ඉකුත් වර්ෂයේදී ලැබී තිබුණු රු. 32,091,746 ක ආදායමෙන් සියයට 32.1 ක් එනම් රු. 10,294,831 ක අතිරික්තයක් ලබා තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ බාහිර පාඨමාලා පවත්වාගෙන යාමේ වියදම් පාලනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

**3.3 විශ්වවිද්‍යාලයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විභාග අක්‍රමිකතා, බඳවා ගැනීම් අක්‍රමිකතා, සේවකයින් පුහුණු කිරීමේ අක්‍රමිකතා, ස්ථාන මාරුවීම් අක්‍රමිකතා, වැටුප් සහ දීමනා ගෙවීම් අක්‍රමිකතා සහ විනය ක්‍රියාමාර්ගවලට එරෙහිව පුද්ගලයන් 12 දෙනෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ නඩු 12 ක් පවරා තිබුණි.

(ආ) විශ්‍රාම ලැබූ නිලධාරියෙකු ඔහු කලින් වෙනත් විශ්වවිද්‍යාලයක සේවය කළ කාලය වෙනුවෙන්ද පාරිතෝෂික ගෙවීම් ඉල්ලමින් 2016 ඔක්තෝබර් 13 දින විශ්වවිද්‍යාලයට එරෙහිව හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා තිබුණි.

(ඇ) සේවය අවසන් කරන ලද නිලධාරිණියක විසින් ලිපිකරු තනතුරෙහි නැවත පිහිටුවන ලෙස ඉල්ලමින් අභියාචනාධිකරණයේ පවරන ලද නඩුව 2009 මාර්තු 05 දින නිශ්ප්‍රභා කර තිබුණු අතර එයට අභියෝග කරමින් ඇය විසින් නැවත ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා තිබුණි. 2019 පෙබරවාරි 01 දින නඩුව විභාගයට ගැනීමට දින නියම කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

### 4.1 කාර්යසාධනය
----------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය
---------------------------------------

ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි බුද්ධාගම පතුරුවාලීම සහ ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය සහ විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම, පාලි භාෂාව, බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ දර්ශනය හැදෑරීම ප්‍රවර්ධනය කිරීම සහ වර්තමාන ලෝක තත්ත්වයට ගැලපෙන පරිදි එම අධ්‍යයන නංවාලීම, පිරිවෙන්වල පාසල්වල හා ඒ හා සමාන ආයතනවල බුද්ධාගම හා පාලි භාෂාව ඉගැන්වීම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ ගිහි පිරිමි ශිෂ්‍යයන් පුහුණු කිරීම යන ප්‍රධාන අරමුණු පදනම් කරගෙන 1981 අංක 74 දරන පනත මඟින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ස්ථාපිත කර තිබුණි.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශය විසින් ඉකුත් වර්ෂයේ සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි 74 ක් සහ පශ්චාත් උපාධි 87 ක් පිරිනමා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි 190 ක් සහ පශ්චාත් උපාධි 160 ක් පිරිනමා තිබුණි. එසේ වුවද ඉකුත් වර්ෂයේ අභ්‍යන්තර විභාග අංශය විසින් සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි සහ විශේෂ ශාස්ත්‍රවේදී උපාධි 90 ක් පිරිනමා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී එය 70 ක් දක්වා පහත බැස තිබුණි.

(ආ) පසුගිය වර්ෂ 5 ක් තුළ විශ්වවිද්‍යාලය විසින් බාහිර උපාධි 1,899 ක් පිරිනමා තිබුණද, එම කාලසීමාව තුළ පිරිනමන ලද අභ්‍යන්තර උපාධි ප්‍රමාණය 374 කට සීමා වී තිබුණි. මේ අනුව විශ්වවිද්‍යාලය සතු සම්පත්වලින් අඩු ප්‍රමාණයක් යොදවා සිදු කරන බාහිර උපාධි පිරිනැමීමට, සාපේක්ෂව ඉතා වැඩි සම්පත් ප්‍රමාණයක් යොදවා පිරිනමන අභ්‍යන්තර උපාධි ප්‍රමාණය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් බඳවා ගැනීම
---------------------------------------

2013 වර්ෂයේ සිට වර්ෂ 5 ක අභ්‍යන්තර ශිෂ්‍ය බඳවා ගැනීම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| අධ්‍යයන වර්ෂය | ඉල්ලුම් කරන ලද සංඛ්‍යාව | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | බඳවා නොගත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2013/2014 | 190 | 93 | 97 |
| 2014/2015 | 255 | 108 | 147 |
| 2015/2016 | 474 | 110 | 364 |
| 2016/2017 | 366 | 130 | 236 |
| 2017/2018 | 287 | 140 | 147 |
| එකතුව | 1,572 | 581 | 991 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂ 5 තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා 1,572 ක් අයදුම් කර තිබුණද, ඉන් 581 ක් පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව බඳවා ගැනීම, අයදුම් කළ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 37 ක් පමණි.මේ අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කරමින් වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් අත්කර ගත හැකි සමාජ ආර්ථික වාසි පිළිබඳව කළමනාකරණයේ ප්‍රමාණවත් අවධානය යොමුව නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 4 (XV) වගන්තිය අනුව කුලී සහ බදු පදනම යටතේ වුවද නේවාසිකාගාර පහසුකම් සපයා ගැනීමට ඉඩකඩ තිබියදීත් එය නොසලකා විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරවල ඉඩකඩ පමණක් සැලකිල්ලට ගෙන බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව සීමා කිරීමට කටයුතු කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන් සඳහා දේශන පැවැත්වීම සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සෑම අධ්‍යයනාංශයක් සඳහාම, අධ්‍යයන වර්ෂය ආරම්භ වීමට ප්‍රථම දේශන පවත්වන ආකාරය, කාලය හා අදාළ දේශකවරුන් වෙන්කරමින් දේශන ප්‍රතිමාණ සැලැස්මක් සැකසිය යුතු වුවද විශ්වවිද්‍යාලයේ පීඨ දෙකෙහිම අධ්‍යයනාංශවලට අදාළව එවැනි දේශන ප්‍රතිමාණ සැලැස්මක් සකසා නොතිබුණි.

(ii) බෞද්ධ අධ්‍යයන පීඨයේ, පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ දේශකවරු 04 දෙනෙකු සඳහා පීඨය මඟින් දෙන ලද පොදු කාල සටහන හා ශිෂ්‍ය අත්සන් ලේඛන සැසඳීමේදී එම දේශකවරුන් අර්ධ වර්ෂයක් සඳහා පැවැත්විය යුතුව තිබුණු දේශන පැය 270 කින් පැය 59 ½ ක් අඩුවෙන් දේශන පවත්වා තිබුණු අතර බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශයේ දේශන කාලසටහන් සහ පැමිණීමේ ලේඛන සැසඳීමේදී විෂයන් 21 ක් සඳහා අභ්‍යන්තර දේශන පැය 24 ක් අඩුවෙන්ද, විෂයන් 20 ක් සඳහා බාහිර දේශන පැය 110 ක් අඩුවෙන්ද දේශන පවත්වා තිබුණු බව නිරීක්ෂණය විය. එලෙස දේශන ප්‍රමාණය අඩු වීම හේතුවෙන් විෂය නිර්දේශයට වන බලපෑම සම්බන්ධයෙන් බෞද්ධ අධ්‍යයන පීඨය ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(iii) භාෂා අධ්‍යයන පීඨයේ සිංහල අධ්‍යයනාංශයේ දේශන සඳහා බඳවාගත් බාහිර දේශකවරුන් දෙදෙනෙකු පිළිවෙලින් පැය 41 ක් හා පැය 57 ක් අඩුවෙන් දේශන පවත්වා තිබුණු අතර සංස්කෘත අධ්‍යයනාංශයේ දේශන කාලසටහන් සහ ශිෂ්‍ය පැමිණීමේ ලේඛන සැසඳීමේදි කාලසටහන් අනුව පැවැත්විය යුතු දේශන පැය සංඛ්‍යාවට වඩා විෂයන් 09 ක් සඳහා අභ්‍යන්තර දේශන පැය 109 ක් අඩුවෙන්ද විෂයන් 12 ක් සඳහා බාහිර දේශන පැය 215 ක් අඩුවෙන්ද දේශන පවත්වා තිබුණි. තවද, පාලි අධ්‍යයනාංශයේ 2017 අධ්‍යයන වර්ෂයේ පළමු සමාසිකය තුළ දේශන පැවැත්වීමේ කාලසටහන හා සිසුන්ගේ අත්සන් ලේඛන සැසඳීමේදී කාලසටහනට අනුව විෂයන් 28 ක් සඳහා පැය 150 ක් අඩුවෙන් දේශන පවත්වා තිබුණු බව නිරීක්ෂණය විය. එලෙස දේශන පැය ගණන් අඩු වීම හේතුවෙන් විෂය නිර්දේශයන් සීමා කිරීමට සිදුවීම සම්බන්ධයෙන් භාෂා අධ්‍යයන පීඨය ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(iv) භාෂා අධ්‍යයන පීඨයේ පාලි අධ්‍යයනාංශයේ ශිෂ්‍යයන්ගේ අත්සන් ලේඛනවල අවස්ථා 11 කදීද, බෞද්ධ අධ්‍යයන පීඨයේ බෞද්ධ සංස්කෘතිය අධ්‍යයන අංශයේ ශිෂ්‍ය අත්සන් ලේඛනවල අවස්ථා 8 කදීද, දේශන පැවැත්වූ වේලාවට වැඩි කාලයක් එකතු වන පරිදි දේශන පැවැත්වූ වේලාවන් වෙනස් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලට යාබද ඉඩමේ පිහිටි හෝමාගම දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය විසින් එහි මායිම් වැට ඉදිකිරීමේදී පීඨ පරිශ්‍රය හා පරිපාලන ගොඩනැගිල්ල අතර දුරකථන පද්ධතියේ භූගත රැහැන්වලට හානි සිදුවී තිබුණි. 2017 මාර්තු 23 දින එම රැහැන් අළුත්වැඩියා කිරීම සඳහා විශ්වවිද්‍යාලයට රු. 514,625 ක වියදමක් දැරීමට සිදුවී තිබුණි. මෙම හානියට වගකිව යුතු හෝමාගම දිස්ත්‍රික් කෘෂිකර්ම මධ්‍යස්ථානයෙන් එම අලාභය අයකරගැනීමට කළමනාකරණය ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) අපේක්ෂිත පාරිභෝජන ප්‍රමාණය නිවැරදිව ඇස්තමේන්තු නොකර තොග පවත්වා ගැනීම සහ අදාළ අංශවලින් ඉල්ලුම් කරන ප්‍රමාණවලට වැඩියෙන් මිලදී ගැනීම යනාදී කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ භාවිතයෙන් ඉවත්කිරීමට නිර්දේශිත රු. 345,642 ක් වූ භාණ්ඩ තොගවලින් සියයට 98 ක්ම ටෝනර් සහ කාට්රිජ්වලින් සමන්විත වී තිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 204 ක් වූ අතර ඉන් නිලධාරීන් 43 දෙනෙකුට අදාළ තනතුරු පුරප්පාඩුවී පැවතුණි. මේ අනුව අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 59 කින් කථිකාචාර්ය තනතුරු 10 ක් සහ පුස්තකාලයාධිකාරී තනතුරද, අනුමත පරිපාලන තනතුරු 13 කින් නියෝජ්‍ය ලේඛකාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී සහ සහකාර ලේඛකාධිකාරී යන තනතුරු 01 බැගින් ද පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2015 මාර්තු 30 දින සිට පුරප්පාඩුව පැවති විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිකාරී තනතුර සඳහා සුදුසු අයෙකු බඳවා ගැනීමට කටයුතු කරමින් පවතිද්දී සප්ත වාර්ෂික නිවාඩු ලබා ඇති වෙනත් විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරිවරයකු කොන්ත්‍රාත් පදනම මත වර්ෂයක් සඳහා පත්කිරීමට කටයුතු කරමින් සිටින බව වාර්තා වීමෙන් පසුව එය එලරහිත ක්‍රියාවක් වන බවත් ස්ථිරව පුස්තකාලයාධිකාරී බඳවා ගැනීම කඩිනම් කළ යුතු බවත් 106 වන විගණන හා කළමනාකරණ කමිටුව නිර්දේශ කර තිබුණද එය නොසලකා 2017 අප්‍රේල් 27 දින සිට 2018 මාර්තු 26 දින දක්වා රුහුණු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරිවරයකුට කොන්ත්‍රාත් පදනම මත පත්වීමක් ලබාදී රු. 674,343 ක් වැටුප් සහ දීමනා වශයෙන් ගෙවා තිබුණි. කොන්ත්‍රාත් පත්වීම අවසන් කිරීමෙන් පසුවද 2018 ජූලි මස වන විටත් අදාළ තනතුර පුරප්පාඩුව පැවතුණි.

## 5. තිරසාර සංවර්ධනය

------------------------

### 5.1 තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

--------------------------------------------------

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව දැනුවත්වීම මත විශ්වවිද්‍යාලය විසින් සිය විෂය පථයට අනුව ළගා කර ගත යුතු අරමුණු වශයෙන් "බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම සඳහා අනුබද්ධායතන සමග සන්නිවේදන කටයුතු දියුණු කර ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම" හඳුනා ගෙන තිබුණු අතර එහි විෂය පථයට ගැනෙන අනෙකුත් අරමුණු වශයෙන් විදේශ අනුබද්ධායතන ප්‍රවර්ධනය කිරීම, දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන යටතේ රැකියා සඳහා උපාධිධාරීන් බිහිකිරීම, විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක කරන ප්‍රාග්ධන ව්‍යාපෘති මඟින් රැකියා බිහිකිරීම, බාහිර උපාධි පාඨමාලා තුළින් රැකියා තනතුරු ඉහළ නැංවීමට දායක වීම යන අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කාර්ය භාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයක් ලෙස රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා සිවිල් සංවිධාන යන පාර්ශවයන් හඳුනාගෙන ඇති බව දක්වා තිබුණද, විශ්වවිද්‍යාලය විසින් ඔවුන් නිශ්චිතව හඳුනාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට අදාළ ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපනය නොවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, විශ්වවිද්‍යාලය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟා වීම මැනබැලීම සඳහා නිවැරදි පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සඳහා "ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම" සහ "මූල්‍ය ප්‍රතිපාදන අඩුවීම" යන කරුණු හේතු වී ඇති බව විශ්වවිද්‍යාලය සඳහන් කර තිබුණි.

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළඟා වීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

### 6.1 ප්‍රසම්පාදනය

-------------

විශ්වවිද්‍යාලය ප්‍රසම්පාදන සැලසුමෙන් බැහැරව කටයුතු කළ අවස්ථාවන් කිහිපයක් නිරීක්ෂණය විය.

(අ) කාර්යාල උපකරණ අයිතම 8 කට අදාළ මූලධන භාණ්ඩ ඒකක 38 ක් මිලදී ගැනීම සඳහා රු. 1,325,250 ක් වැය කිරීමට ප්‍රසම්පාදන සැලසුම් සකස් කර තිබුණද, භාණ්ඩ ඒකක 38 වෙනුවට ඒකක 251 ක් මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා වැය කළ මුදල රු. 8,244,910 ක් විය. ඒ අනුව ඇස්තමේන්තු වටිනාකම ඉක්මවා රු. 6,919,660 ක් හෙවත් සියයට 522 ක් වැඩිපුර වැය කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමට ඇතුළත් නොවූ කාර්යාල උපකරණ සහ වෙනත් උපකරණ අයිතම 25 කට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ ඒකක 393 ක් මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා රු. 4,508,101 ක් වැය කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබූ කාර්යාල උපකරණ සහ වෙනත් උපකරණ අයිතම 36 කට අදාල ඇස්තමේන්තු වටිනාකම රු. 6,370,750 ක් වූ භාණ්ඩ ඒකක 68 ක් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**6.2 අයවැය ලේඛනමය පාලනය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත මෙහෙයුම් වියදම රු. මිලියන 259.3 ක් වුවද තත්‍ය වියදම රු. මිලියන 334.4 ක් වූයෙන් ඇස්තමේන්තුව ඉක්ම වූ තත්‍ය වියදම සියයට 28.9 කින් වැඩි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 05 ක් වෙනුවෙන් ඉකුත් වර්ෂයේ තත්‍ය වියදම රු. මිලියන 29.7 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂයේ වියදම රු. මිලියන 21.8 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ සත්‍ය වියදම රු. මිලියන 37.9 ක්ව තිබුණි. මේ අනුව අදාළ ඇස්තමේන්තුව සහ තත්‍ය වියදම අතර සියයට 73.8 ක විචලනයක් නිරීක්ෂණය විය.

(ඇ) විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ආදායම් විෂයයන් 5 කට අදාළව ඉකුත් වර්ෂයේ සත්‍ය ආදායම රු. මිලියන 34.9 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. මිලියන 30.9 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ සත්‍ය ආදායම රු. මිලියන 47.7 ක්ව තිබුණි. මේ අනුව අදාළ ඇස්තමේන්තුව සහ තත්‍ය ආදායම අතර සියයට 54.4 ක විචලනයක් නිරීක්ෂණය විය.

(ඈ) ඉහත සඳහන් කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

**7. පද්ධති හා පාලනයන්**

---------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) තොග පාලනය | තොග පොත් ක්‍රමානුකූලව පවත්වා ගැනීමේ අඩුපාඩු සහ අධීක්ෂණ දුර්වලතා පැවතීම. |
| (ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු නොකළ අවස්ථා පැවතීම |